# 2023 මාර්තු මස 10 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති

## මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2023.03.10 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 08.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 13. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14.එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 22. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණි -

| | |
|---|---|
| 01.ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 02.රාජකුමාර් විදූෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රයානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2023 පෙබරවාරි මස 14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා

සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි,ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2023.02.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනවලට රහිත පිළිගතහැකි සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2023.02.14 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව ඒකමතිකව සභා සම්මත විය.

02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමුකරන ලද පළාත් පාලන ආයතන පරීක්ෂා කිරීම පිළිබඳ විමර්ෂන නිලධාරීන්ගේ පරීක්ෂණ වාර්තාව - 2021 සභාගත කරමි.

03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් ඩෙන්මාර්ක් කසළ අංගනයේ කොම්පෝස්ට් හැලීම සඳහා භාවිතා කරන උදය ඉන්ඩස්ට්‍රීස් වැලිගල්ල ආයතනයෙන් මිළදීගත් කොම්පෝස්ට් හලන යන්ත්‍රයේ පැවති අඩුපාඩු සකස්කිරීම වෙනුවෙන් එම ආයතනයට ගෙවිය යුතු රු.345,000.00ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවට අයත් ඩෙන්මාර්ක් කසළ අංගනයේ කොම්පෝස්ට් හැලීම සඳහා භාවිතා කරන උදය ඉන්ඩස්ට්‍රීස් වැලිගල්ල ආයතනයෙන් මිළදීගත් කොම්පෝස්ට් හලන යන්ත්‍රයේ පැවති අඩුපාඩු සකස්කිරීම වෙනුවෙන් එම ආයතනයට කිහිපවරක් කතා කළත් නමුත් එම ආයතනයේ තිබූ අභ්‍යන්තර ගැටලු හේතුවෙන් එම අඩුපාඩු සකස් කිරීමට පැමිණියේ නැහැ.නමුත් දැන් සම්පූර්ණයෙන් එම අඩුපාඩු සකස්කර තිබෙන නිසා මුදල් ගෙවිය හැකියි.අදාළ තාක්ෂණික වාර්තා අනුව ඔවුන්ට ගෙවිය යුතු රු.345,000.00ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන්නේ නම් යෝජනාව සභා සම්මත කරගැනීම සුදුසුයි.

තීරණය

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවට අයත් ඩෙන්මාර්ක් කසළ අංගනයේ කොම්පෝස්ට් හැලීම සඳහා භාවිතා කරන උදය ඉන්ඩස්ට්‍රීස් වැලිගල්ල ආයතනයෙන් මිළදීගත් කොම්පෝස්ට් හලන යන්ත්‍රයේ පැවති අඩුපාඩු සකස්කිරීම වෙනුවෙන් එම ආයතනයට ගෙවිය යුතු රු.345,000.00ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයෙහි මාස 03කට වඩා වැඩි හිඟ කඩකුළී ශේෂයන් සහිතව කඩ කුළී ගෙවීම පැහැරහැර ඇති පහත සඳහන් කඩ කාමරවල බදුකරුවන්ට රතු නිවේදන යවා දැනුවත් කළද අදාළ හිඟ මුදල් මෙතෙක් නොගෙවීම හේතුවෙන් එම කඩ කාමර මුද්‍රා තැබීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කඩකාමර අංකය | බදුකරුගේ නම | මාසික කුළිය | හිඟ ශේෂය |
|---|---|---|---|---|
| 01 | 14 | ජේ.කේ.ගොඩකුඹුර මයා | රු.5300.00 | රු.31,935.00 |
| 02 | 18 | කේ.පී.ලීලාරත්න මයා | රු.4600.00 | රු.23,900.00 |
| 03 | 19 | එම්.එච්.අනුර උපුල් කුමාර මයා | රු.4300.00 | රු.27,230.00 |
| 04 | 27 | අයි.ඩී.එස්.කේ.ඒ.මැදවල මිය | රු.4700.00 | රු.31,020.00 |
| | | | | රු.114,085.00 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයෙහි මාස 03කට වඩා වැඩි හිඟ කඩකුළී ශේෂයන් සහිතව කඩ කුළී ගෙවීම පැහැර හැර ඇති කඩ කාමරවල බදුකරුවන්ට රතු නිවේදන යවා දැනුවත් කළා.පවතින ආර්ථික ගැටලු සළකා මාස දෙකක් අවස්ථාව ලබා දුන් නමුත් තවමත් අදාළ හිඟ මුදල් නොගෙවීම හේතුවෙන් එම කඩ කාමර මුද්‍රා තැබීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන්නේ නම් යෝජනාව සභා සම්මත කරගැනීම සුදුසුයි.

තීරණය

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයෙහි මාස 03කට වඩා වැඩි හිඟ කඩකුළී ශේෂයන් සහිතව කඩ කුළී ගෙවීම පැහැර හැර ඇති පහත සඳහන් කඩ කාමරවල බදුකරුවන්ට රතු නිවේදන යවා දැනුවත් කළද අදාළ හිඟ මුදල් මෙතෙක් නොගෙවීම හේතුවෙන් එම කඩ කාමර මුද්‍රා තැබීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංකය | කඩකාමර අංකය | බදුකරුගේ නම | මාසික කුළිය | හිඟ ශේෂය |
|---|---|---|---|---|
| 01 | 14 | ජේ.කේ.ගොඩකුඹුර මයා | රු.5300.00 | රු.31,935.00 |
| 02 | 18 | කේ.පී.ලීලාරත්න මයා | රු.4600.00 | රු.23,900.00 |
| 03 | 19 | එම්.එච්.අනුර උපුල් කුමාර මයා | රු.4300.00 | රු.27,230.00 |
| 04 | 27 | අයි.ඩී.එස්.කේ.ඒ.මැදවල මිය | රු.4700.00 | රු.31,020.00 |
| | | | | රු.114,085.00 |

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

දැනට මීටර් සියයක පමණ කොටසක් පමණක් සංවර්ධනය කර ඇති ඇත්ගාල පොදු ඉඩම වම්පස මාර්ගයේ ඉතිරිව ඇති මීටර් තුන්සියයක පමණ කොටස අබලන්ව පවතින බැවින් එම මාර්ගය භාවිතා කිරීම ඉතා අපහසු බවත් එම කොටස පිළිසකර කර දෙන ලෙසත් ඉල්ලමින් ප්‍රදේශවාසීන් සභාව වෙත කරන ලද ඉල්ලීම අනුව ඇත්ගාල පොදු වම්පස මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

දැනට මීටර් සියයක පමණ කොටසක් ඉදිකර ඇති ඇත්ගාල පොදු ඉඩම වම්පස මාර්ගයේ ඉතිරිව ඇති මීටර් තුන්සියයක පමණ කොටස අබලන්ව පවතිනවා.වැසි දිනවල පමණක් නොව අනෙකුත් දිනවලදී පවා එම මාර්ගය භාවිතා කිරීම ඉතා අපහසුයි.අවස්ථා ගණනාවකදී එම කොටස පිළිසකර කර දෙන ලෙස ප්‍රදේශවාසීන් සභාව වෙත කරන ලද ඉල්ලීම් අනුව ඇත්ගාල පොදු වම්පස මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මෙම යෝජනාව පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.එම නිසා යෝජනාව සම්මත කර ගැනිම සුදුසුයි.

තීරණය

දැනට මීටර් සියයක පමණ කොටසක් සංවර්ධනය කර ඇති ඇත්ගාල පොදු ඉඩම වම්පස මාර්ගයේ ඉතිරිව ඇති මීටර් තුන්සියයක පමණ කොටස අබලන්ව පවතින බැවින් එම මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගම්පොළ නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ සිට ජයමාලපුර 8වන සහ 9වන පටුමග යාකෙරෙන මාර්ගයේ අවසන් කොටස වාහන ගමනාගමනයට හා වැසි දිනවලදී පයින් යාමට අපහසු අන්දමින් අබලන් වී ඇති බැවින් එම මාර්ගය දෙපස පදිංචි ජනතාව සහ මාර්ගය භාවිතා කරන හලාගම හා බ්‍රේසයිඩ් ජනපදවාසීන් විශාල අපහසුතාවයකට පත්ව ඇති බවත් අබලන්ව ඇති මාර්ග කොටස කාණු සහිතව පිලිසකර කර දෙන මෙන් ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.ඒ අනුව ගම්පොළ නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ සිට ජයමාලපුර 8වන සහ 9වන පටුමග යාකෙරෙන මාර්ගයේ අබලන්ව ඇති කොටස පිළිසකර කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගම්පොළ නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ සිට ජයමාලපුර 8වන සහ 9වන පටුමග යාකෙරෙන මාර්ගයේ අවසන් කොටස වාහන ගමනාගමනයට හා වැසි දිනවලදී පයින් යාමට අපහසු අන්දමින් අබලන් වී ඇති බැවින් එම මාර්ගය දෙපස පදිංචි ජනතාව සහ මාර්ගය භාවිතා කරන හලාගම හා බ්‍රේසයිඩ් ජනපදවාසීන් විශාල අපහසුතාවයකට පත්ව ඇති බවත් අබලන්ව ඇති මාර්ග කොටස කාණු සහිතව පිලිසකර කර දෙන මෙන් ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව ගම්පොළ නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ සිට ජයමාලපුර 8වන සහ 9වන පටුමග යාකෙරෙන මාර්ගයේ අබලන්ව ඇති කොටස පිළිසකර කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මෙම යෝජනාව පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.එම නිසා යෝජනාව සම්මත කර ගැනිම සුදුසුයි.

තීරණය

ගම්පොළ නාවලපිටිය ප්‍රධාන මාර්ගයේ සිට ජයමාලපුර 8වන සහ 9වන පටුමග යාකෙරෙන මාර්ගයේ අබලන්ව ඇති කොටස කාණු සහිතව පිළිසකර කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව.09.55ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා සභා ගර්භයට පැමිණියේ ය.

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසි යෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර යටතේ ගෙවිය යුතු හතරවන බිල්පත වන රුපියල් 5,846,117.90 ක මුදලක් අදාළ කොන්ත්‍රාත් ආයතනය වන කවිඳු බිල්ඩර්ස් වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර යටතේ ගෙවිය යුතු හතරවන බිල්පත වන රුපියල් 5,846,117.90ක මුදලක් සඳහා ගෙවීම් කළ යුතුව පවතිනවා.ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ සහ සභාවේ තාක්ෂණ නිලධාරී අධීක්ෂණයෙන් පසුව මෙම බිල්පත ඉදිරිපත් කර තිබෙනවා.නමුත් සභාව සතුව

මූල්‍යමය ගැටලුවක් පවතිනවා. ඉදිරි සතියේදී මුද්දර ගාස්තු හා උසාවි දඩ ලැබුණහොත් මෙම ගෙවීම් සිදුකළ හැකියි.ඒ අනුව අදාළ කොන්ත්‍රාත් ආයතනය වන කවිඳු බිල්ඩර්ස් වෙත මෙම බිල්පත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන්නේ නම් යෝජනාව සභා සම්මත කරගැනීම සුදුසුයි.

තීරණය

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර යටතේ ගෙවිය යුතු හතරවන බිල්පත වන රුපියල් 5,846,117.90 ක මුදලක් අදාළ කොන්ත්‍රාත් ආයතනය වන කවිඳු බිල්ඩර්ස් වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

සූර්ය පැනල සවිකර නොමැති ගොඩනැගිලි වහලවල් සඳහා සූර්ය පැනල සවිකිරීමට බදු පදනම මත පෞද්ගලික අංශයට ලබාදීමට හැකි ගොඩනැගිලි පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.ඒ අනුව ගඟ ඉහල කෝරළේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වහළයේ වර්ග කිලෝ මීටර් 1800ක ප්‍රදේශයක මත සූර්ය පැනල සවිකිරීම සඳහා පෞද්ගලික අංශයට ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

සූර්ය පැනල සවිකර නොමැති ගොඩනැගිලි වහලවල් සඳහා සූර්ය පැනල සවිකිරීමට බදු පදනම මත පෞද්ගලික අංශයට ලබාදීමට හැකි ගොඩනැගිලි පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වහළයේ වර්ග කිලෝ මීටර් 1800ක ප්‍රදේශයක මත සූර්ය පැනල සවිකිරීම සඳහා පෞද්ගලික අංශයට ලබාදීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය

සූර්ය පැනල සවිකර නොමැති ගොඩනැගිලි වහලවල් සඳහා සූර්ය පැනල සවිකිරීමට බදු පදනම මත පෞද්ගලික අංශයට ලබාදීමට හැකි ගොඩනැගිලි පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා තිබෙනවා.ඒ අනුව ගඟ ඉහල කෝරළේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වහළයේ වර්ග කිලෝ මීටර් 1800ක ප්‍රදේශයක මත සූර්ය පැනල සවිකිරීම සඳහා පෞද්ගලික අංශයට ලබාදීම සුදුසු බවට මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

නව තනතුරු ඇති කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද හොත් පමණක් රියදුරු තනතුරු 03ක් සහ විදුලි කාර්මික සහයක තනතුරු 01ක් සඳහා පුරප්පාඩුව පවතින අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරුවල බහුකාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීම යටතේ බහුකාර්ය කාර්යය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීමටත් එම තනතුරු සඳහා බහුකාර්ය සංවර්ධන

දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරන රු.22,500.00ක මුදල සහ අදාළ තනතුරුවලට හිමි වැටුප් හා දීමනා අතර වෙනස සභා අරමුදලෙන් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

රියදුරු තනතුරු 03ක් සහ විදුලි කාර්මික සහයක තනතුරු 01ක් වශයෙන් නව තනතුරු ඇති කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබෙනවා.අනුමැතිය ලද හොත් පමණක් පුරප්පාඩුව පවතින අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරුවල බහුකාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීම යටතේ බහුකාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීමටත් එම තනතුරු සඳහා බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරන රු.22,500.00ක මුදල සහ අදාළ තනතුරුවලට හිමි වැටුප් හා දීමනා අතර වෙනස සභා අරමුදලෙන් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

මූලාසනයේ ගරු සභාපතිතුමනි,ආයතනයට අත්‍යවශ්‍ය පිරිස ආයතනයට අන්තර්ග්‍රහණය කරගැනීමට කටයුතු කිරීම සුදුසුයි.පළාත් පාලන ආයතනයක නීති රීති අනුව හා පළාත් පාලන ආයතනයට අදාළ සහ තනතුරට අදාළ රාජකාරි කිරීමට කැමති සේවකයින් පමණක් ස්ථිර කිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

අඩු ආදායම්ලාභී සහ 9 ශ්‍රේණිය හෝ සා/පෙළ විෂයන් හයක් සමත් ආදී වශයෙන් වූ නිර්ණායක සළකා බැලීමෙන් අනතුරුව මෙම පත්වීම් ප්‍රදානය කරනු ලැබුවා.නමුත් අදාළ ආයතනවලින් එම බඳවාගත් පිරිස අදාළ ක්‍රියාවලියේ යෙදවූයේ නැහැ.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධයෙන් වෙනත් අදහස් නොමැති නම් යෝජනාව සම්මත කරගැනීම සුදුසුයි.

තීරණය

නව තනතුරු ඇති කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද හොත් පමණක් රියදුරු තනතුරු 03ක් සහ විදුලි කාර්මික සහයක තනතුරු 01ක් සඳහා පුරප්පාඩුව පවතින අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරුවල බහුකාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීම යටතේ බහුකාර්ය කාර්යය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීමටත් එම තනතුරු සඳහා බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරන රු.22,500.00ක මුදල සහ අදාළ තනතුරුවලට හිමි වැටුප් හා දීමනා අතර වෙනස සභා අරමුදලෙන් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරී පී.පී.එස්.ජේ.කිත්සිරි මයා වසර 05ක සේවා කාලය සම්පූර්ණ වීම හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා ඇත.පරිසර අංශයේ සහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතු ඉතා වගකීමෙන් ඉටු කරන බැවින් සේවා අවශ්‍යතාවය සළකා ඔහුගේ ස්ථානමාරු නියෝගය වසරක කාලයක් සඳහා අත්හිටුවීමට අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පට්ටිපොළ සුමනරතන හිමි.

මා විසින් එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

පී.පී.එස්.ජේ.කිත්සිරි මහතාට වසර 05ක සේවා කාලය සම්පූර්ණ වීම හේතුවෙන් ගම්පොළ කලාප කාර්යාලයට වාර්ෂික ස්ථාන මාරු ලැබී තිබෙනවා.කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් පිළිබඳව එතුමා මනා පරිචයකින් කටයුතු කළා.කසළ කළමනාකරණය පිළිබඳ විදෙස් පුහුණුවලට පවා එතුමා සහභාගි වුණා. එසේම ඒ කාර්යයන් වෙනත් අයෙකුට පුරුදු කිරීමට හැකියාව ලැබුණේ නැහැ.එම නිසා ඔහුගේ ස්ථානමාරු නියෝගය වසරක කාලයක් සඳහා අත්හිටුවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගත යුතුයි.එම කාලය තුළ වෙනත් නිලධාරියෙක් පුහුණු කිරීමට කටයුතු කිරීමට අපේක්ෂා කරනවා.පරිසර අංශයේ සහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතු ඉතා වගකීමෙන් ඉටු කරන බැවින් සේවා අවශ්‍යතාවය සළකා ඔහුගේ ස්ථානමාරු නියෝගය වසරක කාලයක් සඳහා අත්හිටුවීමට අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමා ,ඉන්දීය පුහුණු වැඩසටහන සඳහා එතුමා යොමු කළේ වසර දෙක තුනක් හෝ මෙම ආයතනයේ සේවය කළ යුතුය යන පදනම මතයි.ඒ දැනුම මෙම ආයතනයට ලබාගත යුතුයි.

තීරණය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරී පී.පී.එස්.ජේ.කිත්සිරි මයා පරිසර අංශයේ සහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතු ඉතා වගකීමෙන් ඉටු කරන බැවින් සේවා අවශ්‍යතාවය සළකා ඔහුගේ ස්ථාන මාරු නියෝගය වසරක කාලයක් සඳහා අත්හිටුවීමට අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරී පී.පී.එස්.ජේ.කිත්සිරි මයා පරිසර අංශයේ සහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතු ඉතා වගකීමෙන් ඉටු කරන බැවින් සේවා අවශ්‍යතාවය සළකා ඔහුගේ ස්ථාන මාරු නියෝගය වසරක කාලයක් සඳහා අත්හිටුවීමට අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

මා විසින් එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති ආපදා නව ගම්මානය සඳහා පානීය ජලය ලබා දෙන ලෙස එහි පදිංචිකරුවන් විසින් විටින් විට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.එම ගම්මානයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා අප ප්‍රාදේශීය සභාව මගින් ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

මෙම ගම්මානයේ සිටින්නේ විවිධ ප්‍රදේශවලින් පැමිණි ආපදාවන්ට ලක්වූ ජනතාවයි.කාලාන්තරයක් මුළුල්ලේ පානීය ජලය ලබාදෙන ලෙස මෙම ජනතාව ඉල්ලා සිටිනවා.මේ සම්බන්ධයෙන් කාරුණිකව සළකා බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි ,ඔබතුමා විසින් ගෙන ආ යෝජනාවට මම එකහෙලා අනුමත කරනවා.මේ සියලු දෙනා ආපදාවන්ට ලක්වූ අයයි.පානීය ජලය ලබා දීම සඳහා රුපියල් ලක්ෂ පහළොවක් යොදවා ළිඳක් සෑදූ අතර නළ පද්ධතිය සම්බන්ධකර ව්‍යාපෘතිය අවසන් කළ නමුත් එවකට පවුල් හයක් පමණක් පදිංචිව

**සිටියා.ප්‍රජාමූල සංවිධානයේ නීතිරීතිවලට අනුව රු.33,000.00ක මුදලක් ජල සම්බන්ධතාවය ලබාදීම සඳහා ගෙවිය යුතුයි.එම මුදල ගෙවීමට හැකියාවක් තිබුණේ නැහැ.කෙසේ නමුත් එම ජනතාවට ජලය ලබාදිය යුතුයි.එම නිසා මෙම යෝජනාවට අනුමැතිය ලබාදිම ඉතාම සුදුසු බව මගේ අදහසයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා**

**ගරු සභාපතිතුමනි.මෙම ව්‍යාපෘති සඳහා ජනතාව ශ්‍රමයෙන් අති විශාල දායකත්වයක් දැරුවා.කොන්ක්‍රීට් කිරීම සඳහා දිවා රෑ වෙහෙස වුවා.එම නිසා ඉන්පසුව මෙහි ප්‍රතිලාභ ලබන ජනතාවගෙන් ජල සම්බන්ධතාවය ලබා දිම සඳහා මෙවන් මුදලක් අය කිරීම සාධාරණයි.**

**ගරු සභාපතිතුමා**

**ඇස්තමේන්තුව සකසා සභාවට මුදල් අයකරගත හැකි වනසේ මීටර් සවිකර මෙම ජල ව්‍යාපෘතිය සභාව මගින් ක්‍රියාත්මක කිරීම සුදුසුයි.**

**තීරණය**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති ආපදා නව ගම්මානයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා අප ප්‍රාදේශීය සභාව මගින් ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සුදුසු බවටත් ඒ සඳහා සභා අරමුදල් මගින් පළමු අදියර සඳහා රු.1,523,702.12 ක් හා දෙවන අදියර සඳහා රු.1,611,565.24ක ඇස්තමේන්තුගත මුදලක් යෙදවීම සුදුසු බවටත් ගරු මහා සභාව තිරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**06:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

# ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාව

## පොදු විනෝදය සඳහා වූ ස්ථාන සැපයීම වෙනුවෙන් අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

ගඟ ඉහළ කොරළේ බල ප්‍රදේශයේ අසුපිණි ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන පුද්ගලයින් සඳහා පොදු පහසුකම් සපයා දීම, විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම, සඳහා වූ අතුරු ව්‍යවස්ථාවයි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් 122 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 126(vi) (අ) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරකයින් වෙනුවෙන් පොදු විනෝදය සඳහා පවත්වාගෙන යන අසුපිණි ඇල්ල නැරඹුම් ස්ථාන සභාවේ යෝජිත සම්මුතියක් මඟින් තීරණය කර එම තීරණය 1 වන උපලේඛනය යටතේ ප්‍රකාශයට පත් කළ යුතු අතර එකී තීරණය ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.
2. ඉහත 1 වගන්තිය යටතේ පොදු විනෝදය සඳහා පවත්වාගෙන යා යුතු ස්ථාන සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම් සභා සම්මුතියන් මඟින් කළ හැකි අතර එකී තීරණය ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

3. පොදු විනෝදය සඳහා වූ මෙම අසුපිණි ඇල්ල නැරඹුම් පරිශ්‍රයේ අවශ්‍ය වැසිකිළි පහසුකම්, රථවාහන නැවතුම් ස්ථාන, පානීය ජල පහසුකම් ආදී පොදු පහසුකම් ප්‍රාදේශීය සභාව විසින් සැපයිය යුතුය.

   අ. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සංචාරක අසුපිණි ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින් විසින් ප්‍රාදේශීය සභාව මඟින් සභා සම්මුතිය අනුව තීරණය කර ප්‍රකාශයට පත් කරන ලද ගාස්තු හා සේවා වෙනුවෙන් වියදම් පියවා ගැනීම සඳහා සභාව විසින් දෙවන උපලේඛනයේ දැක්වෙන මිල ගණන් යටතේ නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රයක් මිලදී ගත යුතුය.

   ආ. ඉහත 3 අ වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව මඟින් නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රය සංචාරකයින් විසින් මිලදී ගනු ලබන දිනට පමණක් වලංගු විය යුතුය.

   ඇ. ඉහත 3 අ වගන්තිය ප්‍රකාරව ප්‍රවේශ පත්‍ර ගාස්තු සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම් සම්මුතියන් මඟින් එසේ කළ හැකි අතර එකී තීරණය ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

   ඈ. ඉහත වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව මඟින් නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රය සභාපතිවරයා හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියෙක් හෝ ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක සංචාරකයින් විසින් ඉදිරිපත් කළ යුතුය.

   ඉ. පොදු විනෝදය සඳහා වූ ස්ථාන නැරඹීම පෙ.ව. 8.00 සිට පස්වරු 5.00 දක්වා කාලය තුළ ක්‍රියාත්මක විය යුතුය.

   ඊ. ඉහත 1 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා සම්මුතියන් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කර ඇති පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර අසුපිණි ඇල්ල නැරඹීම සඳහා වෙනත් කිසිදු ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

   උ. මෙම ස්ථානය නැරඹීමට පැමිණෙන්නන් විසින් මෙම පරිශ්‍රයේ කසල බැහැර කිරීමට තබා ඇති බඳුන් වලට හැර වෙනත් කිසිම ස්ථානයකට හෝ දිය ඇල්ලට කිසිම අපද්‍රව්‍යයක් බැහැර නොකළ යුතුය.

4. කවර හෝ තැනැත්තකු විසින් මත්ද්‍රව්‍ය, දුම්වැටි භාවිත කිරීමෙන් හෝ අනිසි ලෙස හැසිරීම හෝ වෙනත් පීඩාකාරී ක්‍රියාවක් හෝ නොකළ යුතු අතර එවැනි ක්‍රියාවක් කිරීම සඳහා ඉඩ නොදීමට මෙම අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය භාරව ප්‍රවේශ පත්‍ර නිකුත් කරන නිලධාරියාට හෝ සභාපතිවරයා විසින් බලය පවරා ඇති අයෙකු හට බලය හිමි විය යුතුය.
5. සභාව විසින් නරඹන්නන්ගේ ආරක්ෂාව වෙනුවෙන් දැන්වීම් පුවරු මඟින් සපයා ඇති උපදෙස් හා මඟපෙන්වීම් පිළිපැදිය යුතු වේ. එම උපදෙස් වලට පටහැනිව කටයුතු කිරීමෙන් නරඹන්නන්ට සිදුවන අනතුරු සඳහා සභාව වගකීමට යටත් නොවිය යුතුය.
6. උපලේඛන අංක 01 හි දක්වා ඇති නැරඹුම් මැදිරිය තුළ නරඹන්නන් වරකට සිටිය යුතු උපරිම සංඛ්‍යාව 50කට සීමා විය යුතුය.
7. මෙම අසුපිණි ඇල්ල පරිශ්‍රය තුළට ඇවිලෙන සුළු ද්‍රව්‍ය රැගෙන යාම නොකළ යුතුය.
8. මෙම අතුරු ව්‍යවස්ථාවට අදාළ කටයුතු නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම, සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එහි සභාපතිවරයා විසින් ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධාරියෙකුට ලිඛිතව බලය පවරා තිබීම නිත්‍යානුකූල විය යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම හෝ කඩ කිරීම සිදුවන ඕනෑම අවස්ථාවකදී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ අදාළ බලධාරීන්ට හෝ ලිඛිතව, වාචිකව හෝ දුරකථනයෙන් හෝ ඕනෑම අවස්ථාවකදී වාර්තා කිරීම හෝ පැමිණිලි කිරීම ඕනෑම පුරවැසියෙකුට හිමිකම තිබිය යුතුය.
10. ඉහත වගන්ති ප්‍රකාරව ලැබෙන සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු හෝ පරීක්ෂා කළ යුතුය.
11. මෙම අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳව පරීක්ෂා කිරීම හෝ අධීක්ෂණය කිරීමේ බලතල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු සතු විය යුතුය.
12. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මඟින් එකී වරදට, වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝණය නොකඩවා තවදුරටත් සිදුකරන විටක නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝණය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම හෝ තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්ති (2) උප වගන්තියේ නියම කර ඇති දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.
13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයෙන් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ "සභාව" යන්නෙන් ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාව ද "සභාපති" යන්නෙන් ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද "ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය" යන්නෙන් ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද, "අනිසි ලෙස" යන්නෙන් පුරුෂ පක්ෂය යටිකය නිර්වස්ත්‍රයෙන් ද, ස්ත්‍රී පක්ෂය අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් නිර්වස්ත්‍රයෙන් ද යුතු වීමය.
14. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල භාෂා හි අර්ථය දෙමළ භාෂාවේ අර්ථයට අනුරූප වන අතර යම් ව්‍යාකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂාවෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්විය යුතුය.

## උපලේඛනය 01

**පොදු විනෝදය සඳහා වෙන් කරන ලද ස්ථාන**

1. නාන තටාකය ලෙස පවත්වාගෙන යන මධ්‍යස්ථානය
2. පළමු නැරඹුම් ස්ථානය (නුග ගස පිහිටි ස්ථානය)
3. නැරඹුම් මැදිරිය

## උපලේඛනය 02

**ගාස්තු අය කිරීම**

| කාණ්ඩය | ටිකට්පතක වටිනාකම |
|---|---|
| ළමා | **50** |
| වැඩිහිටියන් | **100** |

| | |
|---|---|
| විදෙස් සංචාරකයින් | 500 |
| රථවාහන ගාල් කිරීමේ ගාස්තු | 50 |
| | |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,මේ සම්බන්ධයෙන් අලුතින් නීතියක් සම්පාදනය කරගත යුතුයි.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය කරගත යුතුයි.මෙහි අඩුපාඩු ඇත්නම් සංශෝධනය කිරීම සුදුසු බව මගේ අදහසයි.

තීරණය

අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තිරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර - 01 ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් 2023-05-12 දක්වා දීර්ඝ කරන අතර එම කාලය කර්මාන්තයේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව කොන්ත්‍රාත්කරු දන්වා ඇති අතර මෙම කර්මාන්තය නැවත ටෙන්ඩර් කිරීම මගින් සභාවට විශාල වැය බරක් දැරීමට සිදුවන බැවින් එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2023-03-10 වන දින සිට මාස 06ක් දක්වා දීර්ඝ කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර - 01 ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් 2023-05-12 දක්වා දීර්ඝ කරන බව දන්වා තිබෙනවා. එම කාලය කර්මාන්තයේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව කොන්ත්‍රාත්කරු දන්වා තිබෙනවා.ගොඩනැගිලි ද්‍රව්‍ය හා ඉන්ධන හිඟතාවය සහ වෙළඳපොළ මිළ ඉහළයාම හේතුවෙන් වෙනස් වූ මිළ විචලනයන්ට අනුමැතිය ලබා ගැනීම සඳහා කාලය ගතවීමත් නිසා මෙම ව්‍යාපෘතියේ කාලය දිර්ඝ කරන ලෙස ඉල්ලා තිබෙනවා.නමුත් මෙම කර්මාන්තය නැවත ටෙන්ඩර් කිරීම මගින් සභාවට විශාල වැය බරක් දැරීමට සිදුවන බැවින් එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2023-03-10 වන දින සිට මාස 06ක් දක්වා දීර්ඝ කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේ සම්බන්ධව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර - 01 ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව විසින් 2023-05-12 දක්වා දීර්ඝ කරන අතර එම කාලය කර්මාන්තයේ ඉතිරි වැඩ

**නිමකිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් හා මෙම කර්මාන්තය නැවත ටෙන්ඩර් කිරීම මගින් සභාවට විශාල වැය බරක් දැරීමට සිදුවන බැවින් එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2023-03-10 වන දින සිට මාස 06ක් දක්වා දීර්ඝ කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## 07 කාරක සභා වාර්තා සළකා බැලීම

### 07:01 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

**2022.03.07 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2023 පෙබරවාරි මස මුළු ලැබීම් රු:19,695,065.01ක් ද මුළු වියදම රු.21,491,546.06ක් ද විය. 2023 පෙබරවාරි මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය 2023.03.06 වන දින මහනුවර විගණන අධිකාරි වෙත යොමුකර ඇත.**

### 07:02 පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව

**2023 මාර්තු මස 07 වන දින පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභා වාර්තාව සභාගත කරන ලදී.**

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

**2022-12-23 සිට 2022-12-30 දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදී.**

| අනු අංකය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර් අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 2023.03.03 | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2023.03.02 දින සිට 2022 මූල්‍ය ප්‍රකාශනය විගණනය කිරීම සඳහා ජාතික විගණන කාර්යාලයෙන් පැමිණෙන විගනණ නිළධාරීන්ගේ සංග්‍රහ කටයුතු සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 252 | - | 5,000.00 |
| 2 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ඩෙන්මාර්ක් කසල අංගනයේ සේවයේ යොදවා ඇති සෞඛ්‍ය කම්කරුවන් සඳහා දෛනික වැටුප් ගෙවීම | 253 | 17,908.23 | 137,776.92 |
| 3 | | ටී.සී. ප්‍රීතිකා ද සිල්වා - ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරී | 2023.02.24 වන දින මු.රෙ. 104 පරීක්ෂණය පිළිබඳ පුහුණුවක් සඳහා මහනුවර නවයාලතැන්නට යාම සඳහා ගමන් වියදම් ගෙවීම | 254 | - | 1,238.00 |
| 4 | | ඩබ්. ජනජීව - සංවර්ධන නිළධාරී | 2023.02.24 වන දින මු.රෙ. 104 පරීක්ෂණය පිළිබඳ පුහුණුවක් සඳහා මහනුවර නවයාලතැන්නට යාම සඳහා ගමන් වියදම් ගෙවීම | 255 | - | 1,246.00 |
| 5 | | ඩබ්.ඩී.එන්.ඩී.එල්. වික්‍රමසිංහ - සංවර්ධන නිළධාරී | මුද්දර ගාස්තු උපලේඛණ සඳහා මහනුවර ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයට හා පල්ලේකැලේ පළාත් සභා සංකීර්ණයට 2023.02.24 දින යාම සඳහා ගමන් වියදම් ගෙවීම | 256 | - | 1,452.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | | පී.පී.එස්.පී. කිත්සිරි - සංවර්ධන නිළධාරී | 2023 පෙබරවාරි මස පරිවර්තන ගමන් වියදම් ගෙවීම | 257 | - | 4,700.00 |
| 7 | | පී.පී.එස්.පී. කිත්සිරි - සංවර්ධන නිළධාරී | උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා 2023.02.28 වන දින නවයාලතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම සඳහා ගමන් වියදම් ගෙවීම | 258 | - | 1,572.00 |
| 8 | | අයි.පී. පුෂ්පලාල් - කා.කා.ස | 2023 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 259 | - | 5,637.51 |
| 9 | | කේ.ඩබ්.පී. රංජිත් රුවන් කුමාර - කාර්යාල කම්කරු | 2023 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 260 | - | 1,263.27 |
| 10 | | එම්.ඒ.ඒ. බාලසූරිය- කා.කා.ස | 2023 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 261 | - | 4,469.50 |
| 11 | | ඩී.කේ.එස්.කේ. මැණිකේ - කළමණාකරණ සේවා නිළධාරී | 2022.12.31 න් අවසන් වර්ෂයේ ගිණුම සකස් කිරීම සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම | 262 | - | 17,052.00 |
| 12 | | ඩී.කේ.එස්.කේ. මැණිකේ - කළමණාකරණ සේවා නිළධාරී | 2022.12.31 න් අවසන් වර්ෂයේ ගිණුම සකස් කිරීම සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට පැමිණීම වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම | 263 | - | 7,097.65 |
| 13 | 2023.03.07 | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2023.02.24 දින ආදර්ශමත් ප්‍රාදේශීය සභාවේ නිරීක්ෂණ කටයුතු සඳහා පැමිණි නිලධාරීන් වෙනුවෙන් සංග්‍රහ කිරීම සඳහා වවුචර් අංක 241 යටතේ ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 264 | 2,150.00 | - |
| 14 | | බී.පී. මිල්ටන්රත්න - මාර්ග කම්කරු | නිවසේ අලුත්වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය ලබා ගැනීම | 265 | 25.00 | 53,375.00 |
| 15 | | එම්.එම්.ඩී.පී. බණ්ඩාර - සංවර්ධන නිළධාරී | 2023 පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 266 | - | 3,900.00 |
| 16 | | එම්.ඩී.සී.කේ. පෙරේරා - කළ. සේවා නිළධාරී | 2024 අයවැය සකස් කිරීමේ පුහුණු වැඩසටහනට සහභාගී වීම සඳහා නවයාලතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම සඳහා ගමන් වියදම් ගෙවීම | 267 | - | 968.00 |
| 17 | | චමිලා උදේකුමාරි - සංවර්ධන නිළධාරී | 2024 අයවැය සකස් කිරීමේ පුහුණු වැඩසටහනට සහභාගී වීම සඳහා නවයාලතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම සඳහා ගමන් වියදම් ගෙවීම | 268 | - | 1,160.00 |
| 18 | | කේ.ඒ.අයි.එච්. වික්‍රමසිංහ - සංවර්ධන නිළධාරී | 2023.02.18,19,25 යන දින වල සේවය කිරීම වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම | 269 | - | 3,352.29 |
| 19 | | එම්.පී. සිසිර කුමාර - වැඩ මූලික | 2023.02.04,11,18,25 යන දින සඳහා අතිකාල දීමනා ගෙවීම | 270 | - | 3,466.66 |
| 20 | | බී.පී. මිල්ටන්රත්න - මාර්ග කම්කරු | 2023.02.04,05,12,18,19 දින සඳහා අතිකාල දීමනා ගෙවීම | 271 | - | 4,375.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 21 | | එම්.පී.එම්. ප්‍රදීප් කුමාර - මුරකරු | ජනවාරි මාසයේ නව ප්‍රාදේශීය සභා කාර්යාලයේ මුර සේවය කිරීම වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම | 272 | - | 4,375.00 |
| 22 | | ආර්.බී. දසනායක රාජපක්ෂ - මාර්ග කම්කරු | 2023.02.18,19,25 දින වල ගල්පාය හා කුරුඳුවත්තට ජලය බෙදාහැරීම වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම | 273 | - | 2,529.16 |
| 23 | | යූ.පී.ඩී.සී. විජේරත්න - සංවර්ධන නිළධාරී | 2023.01.14,15.21.22 දින වල පුස්තකාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වී නිවාඩු දින වැටුප් ලබා ගැනීම | 274 | - | 5,584.00 |
| 24 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | කාර්යාලීය ලිපි තැපැල් කිරීමට අවශ්‍ය මුද්දර ලබා ගැනීම | 275 | - | 10,000.00 |
| 25 | 2023.03.09 | යුනයිටඩ් මෝටර්ස් ලංකා පී.එල්.සී - කටුගස්තොට | CPPF - 7455 කැබ් රථයේ 241800KM සීමාවේ සේවා වාරය සිදුකිරීම සඳහා එම රථයේ නියෝජිත ආයතනයට මුදල් ගෙවීම | 276 | 25.00 | 36,437.11 |
| | | ඩිජිටල් කම්පියුටර් සිස්ටම් | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ පෞද්ගලික ලිපිගොනු විෂය පරිගණකය අක්‍රිය වීම හේතුවෙන් එය අලුත් වැඩියා කිරීමේ ගාස්තු ගෙවීම | 278 | | 2,000.00 |
| **එකතුව** | | | | | **20,108.23** | **320,027.07** |

## 09. වෙනත්

### 1.2022 නොවැම්බර්මස සිට 2023 පෙබරවාරි මස දක්වා පැවති මහා සභාරැස්වීමේදී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය

**2022-11-09 වන දින පැවති ගරු මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය**

| තීරණ අංකය | තීරණය | ගත් ක්‍රියාමාර්ගය /ප්‍රගතිය |
|---|---|---|
| 05:01:01 | 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය අනුමත කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | අනුමත කරන ලද අයවැය ක්‍රියාත්මක කෙරේ. |
| 05:01:02 | 2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ තාක්ෂණික කමිටුව සඳහා ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු- වයි.එම්.සී.යාපා මිය ,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී- පී.පී.සී.කුමාරි මිය,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී - ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මයා යන නිලධාරීන් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:03 | 2022 වර්ෂයේ සභා අරමුදල් හා දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබන නව කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම -1 අදියර ව්‍යාපෘතියේ පළමු බිල්පත වන රු.1,799.282.82ක මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය | අදාළ මුදල ගෙවන ලදී. |

| | | |
|---|---|---|
| | කරන ලදී. | |
| 05:01:04-1 | 2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:01 viii යටතේ මහ සභාවේ සම්මත වූ යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ඡින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් ගරු මහා සභාව තීරණය කරන ලදී.<br><br>"1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරණ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසෙන් වැළඳගෙන ඇති ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමක් වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය." | නව යෝජනාව ගැසට් කරන ලදී. |
| 05:01:04-2 | 2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:01 XI යටතේ මහ සභාවේ සම්මත වූ යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ඡින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් ගරු මහා සභාව තීරණය කරන ලදී.<br><br><u>සම්මත වූ නව යෝජනාව</u><br><br>"1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 2016.02.23 වැනි දිනැති අංක 1955/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2019.03.15 දිනැති අංක 2115 දරණ ගැසට් පත්‍රයේ iv(ආ) කොටසෙන් වැළඳගෙන ඇති කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කුලී රථ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය." | නව යෝජනාව ගැසට් කරන ලදී. |
| 06:01 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාලිගාපුරණ වසමට අයත් ප්‍රදේශයක ගම්පොළ නගර සභාව විසින් මින් පෙර වරිපනම් බදු අය කරන ලද අතර සීමා නිර්ණය කර ගැනීමෙන් පසු ගම්පොළ නගර සභාව විසින් දැනට වරිපනම් අය කිරීම නවතා ඇත.අප ප්‍රාදේශීය සභාව මගින් නැවත එම දේපළ වලට අදාළව වරිපනම් බදු අය කිරීම සඳහා දැනට ලේඛනගත වී ඇති එකී දේපළ වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අවසන් වරට ලබා දී ඇති වාර්ෂික තක්සේරු වටිනාකම එලෙසින් ම පිළිගැනීමටත් ,ඒ අනුව ව්‍යාපාරික ස්ථාන වෙනුවෙන් වාර්ෂික වටිනාකම මත 10%ක සහ නේවාසික ස්ථාන වෙනුවෙන් 8%ක වරිපනම් බද්දක් ද නියම කොට පනවා අය කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | මෙම වසරේ තෙවන කාර්තුවේ සිට බිල් කිරීමට කටයුතු කර ඇත. |
| 06:02 | නව වරිපනම් බදු පැනවීමේ කාර්යය සඳහා දියුණු කළ ප්‍රාදේශ වශයෙන් | ආදායම් පරීක්ෂකවරු |

| | | |
|---|---|---|
| | ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට වීගුලවත්ත හරහා නව වීගුලවත්ත මාර්ගයේ පුද්ගලික බස් නැවතුම්පල පිටුපස කණාමැදිළි ඔය හරහා ඇති යකඩ පාලම දක්වා වූ මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට ,ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට සාලියාවත්ත දක්වා දිවෙන මාර්ගයේ සාලියාවත්ත 03 වන පටුමග ෆාතිමා ෂහීරා මියගේ නිවස දක්වා මාර්ගය දෙපස මීටර් 300ක් දුරට,ගම්පොලවෙල බුදු පිළිමය අසල පීටර් ගඟහ ගෙදර (නිමල් රණසිංහ මයාගේ නිවස) අසල සිට ජයමාලපුර දක්වා දිවෙන මාර්ගයේ උඩුපිටිය හංදිය නසීර් බායි මහතාගේ පරණ යකඩ එකලස් කරන මධ්‍යස්ථානය දක්වා මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට ,ගම්පොල සිට නාවලපිටිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ සමරකෝන් ඉන්ධන පිරවුම්හලට දකුණු පසින් ඇති මැනුවෙල් ශ්‍රීපාලි මයාගේ වාහන අමතර කොටස් වෙළඳසැල සිට නාවලපිටිය දෙසට ඇති සුජාතා ස්ටූඩියෝ වර්ණ රසායනාගාරය දක්වා මාර්ගය දෙපස මීටර් 600ක් දුරට, වීගුලවත්ත ක්‍රීඩාපිටිය සිට මාළිගාපුරණ රජමහා විහාරය තෙක් දිවෙන මාර්ගයේ සරත් බණ්ඩාර පළිපාන මයාගේ නිවසේ සිට මාළිගාපුරණ රජමහා විහාරය දක්වා මාර්ගය දෙපස මීටර් 300ක් දුරට ,පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට විජයාරාම විහාරස්ථානය දක්වා වන කොන්ක්‍රීට් මාර්ගයේ විජයාරාම විහාරස්ථානය තෙක් දෙපස මීටර් 300ක් දුරට ,පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට කොස්ගොල්ල දක්වා වන අතුරු මාර්ගයේ කොස්ගොල්ල මාර්ගය මුණගැහෙන තුන්මංහන්දිය දක්වා එකී මාර්ගයේ දකුණු පස මීටර් 150ක් දුරට ( මාර්ගය වම්පස ගම්පොල නගර සභාවට අයත් සීමාව),පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට ගොඩගම ගංගාතිලක රජමහා විහාරය පිටුපස මායිමෙහි ඇල මාර්ගය අසල අංක 221/4/45 පදිංචි සිව ඥානම් මයාගේ නිවස දක්වා වන මාර්ගය දෙපස මීටර් 300ක් වූ දුරට ද පහළ කුඩමාකේ බුදු පිළිමය අසල තුන්මංහන්දියේ තුසිත ස්ටෝර්ස් සිල්ලර වෙළඳසැල සිට M.G.M.P. සේපාලිකා මියගේ නිවස දක්වා එම මාර්ගයේ වම්පස මීටර් 150ක් දුරට ද ජයමාලපුර 06 වන පටුමග ජයම්පතී නිශ්ශංක ජයසුන්දර මයාගේ මල්පැල අළෙවිසැල සිට ගම්පොලවෙල දෙසට වන මාර්ගයේ උඩුපිටිය හංදියෙහි නසීර් බායි මයාගේ පරණ යකඩ එකලස් කරන මධ්‍යස්ථානය දක්වා වන මාර්ගයේ දෙපස මීටර් 300ක් දුරට යන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගෙන්වා අදාළ දේපළ ලැයිස්තු සැකසීමේ කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇත. |
| 06:03 | උලපනේවත්ත පාර බැම්ම ඉදිකර මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා අදාළ ඇස්තමේන්තු මුදල වන රු.8,759,364.85ක මුදල අදියර 05ක් යටතේ සභාවට ගෙවීමට ලංකා විදුලිබල මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹීමටත් අදියර පහක් යටතේ ප්‍රතිපාදන ලබාදෙන බැවින් එම ව්‍යාපෘතිය සඳහා උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන /සුභසාධක සමිතිය සමග ගිවිසුම්ගතවීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදී. | උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන /සුභසාධක සමිතිය සමග ගිවිසුම්ගතවී ඇත. |
| | | |

**2022-12-06** දින පැවති ගරු මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණ ප්‍රගතිය

| | | |
|---|---|---|
| 05:01:01 | 2022 සැප්තැම්බර් 20 වන දින තීරණ අංක 05:01:09 යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ඡින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් ගරු මහා සභාව තීරණය කරන ලදී.<br>නව යෝජනාව<br>2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් මාර්ග 09ක් මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක අවසරලත් කාලසීමාවක් තුළ එනම් 2022-11-01 සිට 2025-11-01 දක්වා කාල සීමාව ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි. | ගැසට් කිරීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. |
| 05:01:02 | 2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික සංවර්ධන සැළැස්ම, සිව් අවුරුදු සැළැස්ම, කෙටිකාලීන සැළැස්ම, මධ්‍යකාලීන සැළැස්ම හා දිගු කාලීන හෙවත් උපාය මාර්ගික | සැලසුම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී |

| | | |
|---|---|---|
| | සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | |
| 05:01:03 | 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සැලසුම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී |
| 05:01:04 | 2023 වර්ෂයේ ඉහත සඳහන් කර ඇති ආකාරයට සෑම මසකම තුන් වන අඟහරුවාදා දිනයේ පෙ:ව: 09.30ට මහා සභා රැස්වීම් පැවැත්වීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:05 | 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ඵලදායිතා සැළැස්ම හා හරිත ඵලදායිතා සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සැලසුම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී |
| 05:01:06 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.<br>උප ලේඛනය<br>01.එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කමිටු සභාපති<br>02. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - සාමාජික<br>03.ඒ.පී. කොල්වින් සිල්වා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>04.ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>05. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>06.ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>07. එස්.නිලාම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>08.එච්.පී.ආනන්ද කුලතිලක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:07 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ කාර්මික හා කර්මාන්ත කමිටු කාරක සභාවේ සංයුතිය ඉහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.<br>උප ලේඛනය<br>01.ඒ.එස්.ඩබ්.පතිරණ මහතාගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -කමිටු සභාපති<br>02.ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>03.එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>04.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී- සාමාජික<br>05.ඒ.පී. කොල්වින් සිල්වා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>06. එස්. නිලාම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>07.එස්.පී. සරත් කුමාර ලාල් මහතාගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාජික<br>08.ඩී.පී.එන්.දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - සාමාජික | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:08 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාවේ සංයුතිය ඉහත උප ලේඛනයේ | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | සඳහන් ආකාරයට විය යුතු බවටත් එයට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්.නන්දාවතී මහත්මිය කමිටු සමාපිකයෙකු වශයෙන් ඇතුළත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.<br><br>උප ලේඛනය<br>01.ඒ.එස්.ඩබ්.පතිරණ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -කමිටු සභාපති<br>02.ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>03.එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>04.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - සාමාපික<br>05.ඒ.පී. කොල්වින් සිල්වා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>06. එස්. නිලාම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>07.එස්.පී. සරත් කුමාර ලාල් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>08.ඩී.පී.එන්.දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී-සාමාපික | |
| 05:01:09 | ප්‍රාදේශීය සභා අරමුදලෙහි ආදායම් හා වියදම් සම්බන්ධයෙන් හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පවරනු ලබන බලතල හා කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය සභාව සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවක් ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ පත්කර ගත යුතු බවත්, එසේ පත්කර ගනු ලබන 2023 වර්ෂයේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සංයුතිය පහත උප ලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.<br>උප ලේඛනය<br>01.ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කමිටු සභා<br>02. ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>03. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - සාමාපික<br>04. එම්.පී.අබේරත්න බණ්ඩාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>05. එච්.පී.ආනන්ද කුලතිලක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>06. එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>07. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සාමාපික<br>08. රාජකුමාර් විදුෂණී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී -සාමාපික | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:10 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා මුදල් හා කාරක සභාවේ සාමාජිකයින්ගෙන් යුතු ප්‍රසම්පාදන කමිටුව<br>පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.<br>01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා ගරු ප්‍රාදේශීය සභා සභාපති - කමිටු සභා<br>02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - සමාපික<br>03. ආර්.පී. ගුණරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමාපික<br>04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමාපික<br>05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමාපික<br>06. එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමාපික<br>07. ඩී.පී.ඩී.විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීසමාපික<br>08. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමාපික<br>09. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමාපික<br>10. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සමාපික | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:11 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ ලංසු විවෘත කිරීමේ කමිටුව ලෙස ප්‍රාදේශීය සභාවේ ලේකම් - ඩී.එම්.එල්.ඩී. දසනායක මිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - ටී.සී.පී. ද සිල්වා මිය,ආදායම් පරීක්ෂක - ඩබ්.ජේ.පී. ගුණරත්න මයා යන නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:12 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ තාක්ෂණ කමිටුව ලෙස තාක්ෂණ නිලධාරී- ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මයා, තාක්ෂණ නිලධාරී - ඩී.පී. නදුන් ජයසේකර මයා ,සංවර්ධන නිලධාරී (පරිසර) - පී.පී.එස්.ජේ. කිත්සිරි මයා ,සංවර්ධන නිලධාරි - පී.බී.එන්.එම්.රොද්‍රිගෝ මයා යන නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත. |
| 05:01:13 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 පළමු අර්ධ වර්ෂය සහ දෙවන අර්ධ වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැළැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සැලසුම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී |
| 05:01:14 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සැලසුම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී |
| 05:01:15 | 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මානව | සැලසුම් ක්‍රියාත්මක |

<table>
<tr><td></td><td>සම්පත් සංවර්ධන පුහුණු සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.</td><td>කෙරෙමින් පවතී.</td></tr>
<tr><td>05:01:16</td><td>ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද කසළ කළමනාකරණ වැඩ සැළැස්ම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.</td><td>සැලසුම් ක්‍රියාත්මක කෙරෙමින් පවතී</td></tr>
<tr><td>05:01:17</td><td>වසර දෙකක් ඉක්මවා ඇතත් අදාළ කොන්ත්‍රාත් සමිති මගින් ඉල්ලීම් ඉදිරිපත් කර නොමැති පහත සදහන් 10% අතරැදවුම් සඳහා රජයේ ආදායමට ලබා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.
<table>
<tr><th>අනු අංකය</th><th>ව්‍යාපෘතිය</th><th>වර්ෂය</th><th>මුදල රු.ශත</th></tr>
<tr><td>1</td><td>සියරා කන්ට්‍රක්ෂන්ස්</td><td>2013</td><td>2425894.80</td></tr>
<tr><td>2</td><td>හල්දොල ග්‍රාම සංවර්ධන සමිතිය</td><td>2017</td><td>50000.00</td></tr>
<tr><td>3</td><td>ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය</td><td>2018</td><td>2996.35</td></tr>
<tr><td>4</td><td>ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය</td><td>2019</td><td>2448.00</td></tr>
<tr><td>5</td><td>සමගි ගොවි සංවිධානය-පැල්ලපිටිය උතුර</td><td>2019</td><td>8690.00</td></tr>
<tr><td>6</td><td>රන්කෙත ගොවි සංවිධානය ඇත්ගාල</td><td>2019</td><td>20000.00</td></tr>
<tr><td></td><td>එකතුව</td><td></td><td>2510029.15</td></tr>
</table></td><td>ආදායමට ගන්නා ලදී</td></tr>
<tr><td>05:01:18</td><td>පහත සදහන් විවිධ තැන්පත්වල කාලය වසර දෙකක් ඉක්මවා ඇති බැවින් රජයේ ආදායමට ලබා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.
<table>
<tr><th>අනු අංකය</th><th>ව්‍යාපෘතිය</th><th>වර්ෂය</th><th>මුදල රු.ශත</th></tr>
<tr><td>1</td><td>ඒ.සී මැණිකේ වැටුප් හිඟ</td><td>2019</td><td>15828.46</td></tr>
<tr><td>2</td><td>2019 වැටුප් ලේඛනයෙන් අයකර ගත් සේවක ණය</td><td>2019</td><td>3471.58</td></tr>
<tr><td>3</td><td>2019 දේපල තහනම් දඩ</td><td>2019</td><td>3094.65</td></tr>
<tr><td>4</td><td>සේවක ණය</td><td>2020</td><td>73.40</td></tr>
<tr><td></td><td>එකතුව</td><td></td><td>22468'09</td></tr>
</table></td><td>ආදායමට ගන්නා ලදී</td></tr>
<tr><td>05:01:19</td><td>2022 අගෝස්තු මස 16 වන දින තීරණ අංක 06:02 යටතේ මහ සභාවේ සම්මත වූ මගේ පහත යෝජනාව,1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 11 වන වගන්තිය සමග කියවිය යුතු 184 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යතුමාගේ 1988.01.13 දිනැති 488/16 ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 11 දරණ ප්‍රාදේශීය සභා රීතියේ අංක (5)දරණ උපවගන්තියට අනුකූල ලෙස මෙයින් පරිච්ඡින්න කිරීමටත් ඊට පහතින් වූ යෝජනාව ඇතුළත් කිරීමටත් මා විසින් ගරු මහා සභාවට යෝජනා කරමි.<br><u>නව යෝජනාව</u><br>ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් දැනට පවතින කසළ කපන යන්ත්‍රය ප්‍රමාණවත් නොවන බැවින් කසළ කපන යන්ත්‍රයක් මිළදී ගැනීම සුදුසු බවටත් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීම සඳහා රුපියල් ලක්ෂයකට ආසන්න පිරිවැයක් වැයවන බැවින් පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පළ කිරීමෙන් තොරව සහ මධ්‍යම පළාත් සභාවේ 2020 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයට අනුව එම සැපයුම්කරුවන්ගෙන් සහ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ කැඳවීම් කිරීමත් සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.</td><td>2022-12-31 වන දින ජිනසේන ඇග්‍රිකල්චර් පුද්.සමාගමෙන් රු.600,000.00ක මුදලකට මිළදී ගන්නා ලදී.</td></tr>
<tr><td>05:01:20</td><td>ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කසළ කැපීම වෙනුවෙන් කසළකපන යන්ත්‍රයක් මිළදී ගැනීමේ තාක්ෂණ කමිටුව සඳහා ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) - සභාපති වශයෙන් ද ගණකාධිකාරී - පළාත් පාලන දෙපාර්තමේන්තුව - සාමාජික, ලේකම් -ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව - සාමාජික ,වැඩ අධිකාරී-ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සාමාජික , පරිසර නිලධාරී - සාමාජික වශයෙන් ද පත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.</td><td>සභා තීරණය අනුව කටයුතු කර ඇත</td></tr>
<tr><td>05:01:21</td><td>2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත මල්වත්තගම උදාකළ ගම්මානයේ ඉදිකරන ලද බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් 250,000.00ක මුදලක් සභා අරමුදලින් දැරීම වෙනුවෙන් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.</td><td>ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.</td></tr>
<tr><td>05:01:22</td><td>ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පැරණ ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර</td><td>ගරු විෂය භාර අමාත්‍යවරයාගේ</td></tr>
</table>

| | | |
|---|---|---|
| | අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ගොඩනැගිල්ලෙහි පළමු මහළ ලංකා බැංකුව සහ කාර්ගිල්ස් ෆුඩ් කම්පැණි වෙත දීර්ඝකාලීන බදු පදනම මත බදු දීමට අදාළව 2022-06-29වන දිනැති සංශෝධිත සැළැස්ම අනුව පහළ මහලේ වාහන අංගනය ඉදිකෙරෙන කොටසේ කාර්ගිල්ස් ෆුඩ් ආයතනයේ ගබඩාව ඉදිකිරීම සුදුසු බවටත් පළමු මහලේ වාණිජ කටයුතු සඳහා වර්ග අඩි 3698ක ප්‍රමාණයත් සමග මුළු වර්ග අඩි 6587ක ප්‍රමාණයක් කාර්ගිලිස් ෆුඩ් කම්පැණි ආයතනය වෙත වසර තිහක දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවටත් කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සඳහා පළමු මහලේ වර්ග අඩි 1620ක් සමග මුළු වර්ග අඩි 3297ක ප්‍රමාණයක් වසර තිහක දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| 06.01 | 2022 වර්ෂයේ වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව සහ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය සඳහා මල්වත්ත කන්ස්ට්‍රක්ෂන්ස් වෙත රු,**681,835 . 82** ක් ද 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද ගිරාඋල්ල පුරාණ විහාරය අසලින් මලංගමුව මිතලාව දෙසට යන මාර්ගයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය වෙත රු.**1000,000.00** ක් ද වැලිකන්දගම බාලසිංහ මහතාගේ නිවස සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම - පළමු අදියර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සාමග්‍රි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු.**1000,000.00** ක් ද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතිය - පළමු අදියර සඳහා කවිඳු බිල්ඩර්ස් වෙත රු.**4,264,954.37** ක මුදලක් ද ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගෙවීම් සිදුකරන ලදී. |
| 06.02 | එක් එක් අයිතම අනුව සැපයුම්කරුවන් ලියාපදිංචි වීඇති ප්‍රමාණය අවම මට්ටමක පවතින අවස්ථාවලදී මධ්‍යම පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගැනීම සුදුසු බවටත් රු.5000.00 - රු.25,000.00 අතර වටිනාකමක් ඇති ද්‍රව්‍ය සඳහා අතින් ලබාගන්නා ලද මිළ ගණන් 03ක් තාක්ෂණ කමිටුව වෙත යොමු කර මිළ සැසඳුම් කර අවම මිළ හා ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කරමි |
| 06.03 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව නමින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල කල්පිරීමේ කාලය අවසන් වී ඇති බැවින් නැවත අලුත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ස්ථාවර තැන්පතු අලුත් කරන ලදී. |
| 06.04 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක 11 දරණ ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව මාසික කුලී පදනම මත වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත බදු ලබා දී ඇති අතර එහි ගිවිසුම් ගත කාලය 2022.08.31 දිනෙන් අවසන් වන බැවින් එම ගොඩනැගිල්ල නව තක්සේරුව මත පදනම්ව ,ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව,ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව 2022-09-01 දින සිට 2025-08-31 දක්වා වසර 03ක කාලයක් සඳහා ලංකා බැංකු ශාඛාව පවත්වාගෙන යාම සඳහා බදු ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | පළාත් පාලන කොමසාරිස්තුමා මගින් විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට යවා ඇත. |
| 06.05 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක 31 දරණ කඩ කාමරය දැනට ලංකා සතොස ආයතනයේ ශාඛාවක් සහ රට බීමහලක් පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව ,මාසික කුලී පදනම මත වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත බදු ලබා දී ඇති අතර එම ගිවිසුම්ගත කාලය 2023.01.31 දිනෙන් අවසන් වන බැවින් 2022.12.31 දිනෙන් අවසන්වන එම ආයතනයෙහි මත්පැන් බලපත්‍රය නැවත ලබා ගැනීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත සතොස ආයතනයේ ගිවිසුම ඉදිරිපත් කළ යුතු හෙයින් 2022.12.31 දිනට පෙර ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කර දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව අංක 31 දරණ කඩ කාමරය ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව , වසර තුනෙන් තුනට ගිවිසුම් ගතවීමේ පදනම මත හා දැනට අය කරනු ලබන රු.82150.00ක මාසික කුලී මුදලම නව තක්සේරුවක් ලබාගන්නා තෙක් අය කිරීමේ පදනම මත, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව 2023-02-01 දින සිට 2026-01-31 දින දක්වා වසර 03ක කාලයක් සඳහා ලංකා සතොස ආයතනයේ ශාඛාවක් සහ රට බීමහලක් පවත්වාගෙන යාම සඳහා බදු ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගිවිසුම්ගත වී ඇත. |
| 06.06 | 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩිපුර ලද ආදායම් සඳහා සකස් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | පරිපූරක ඇස්තමේන්තුව අනුව වැය කිරීම් සිදුකර ඇත. |
| 06.07 | ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව, බල ප්‍රදේශයේ කොට්ඨාසවල ක්‍රියාත්මක ස්වේච්ඡා සමිති සඳහා ප්ලාස්ටික් පුටු ලබාදීම වෙනුවෙන් රු.1,678,904.10ක මුදලක් 2022 සභා අරුදල් ප්‍රතිපාදන මගින් දැරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදිම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | යෝජනාව පරිච්ඡින්න කරන ලදී |
| | | |

| 2023-01-03 දින පැවති ගරු මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණ ප්‍රගතිය | | |
|---|---|---|
| 05:01:01 | අප ආයතනයේ පවතින සේවා අවශ්‍යතාවය මත මේ වන විට පුරප්පාඩුව පවතින පුස්තකාල සහයක තනතුර සඳහා දෛනික පදනම මත සේවකයෙකු 2022-06-01 දින සිට මාස 06ක කාලයක් සඳහා සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලැබී ඇති නමුත් එවකට පැවති මූල්‍යමය ගැටළු හේතුවෙන් එම තනතුර සඳහා දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීම සිදුනොවූ බැවින් 2023-01-01 සිට මාස 06ක කාලයක් සඳහා දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | අනුමැතිය ලබාගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් සිදුකර ඇත. |
| 05:01:02 | දැනට අංක 242,රිවරිනා වත්ත,උලපනේ යන ලිපිනයෙහි පදිංචි ටී.කේ.සාමත් යන අයට අයිතිය ඇති ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 11 දරණ කඩ කාමරයේ අයිතිය අතර සිය දියණිය වන ශෙහානා සාමත් යන අයට කඩ කාමරයේ අයිතිය පැවරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම අනුව දැනට පවතින හිඟ කඩ කාමර කුලිය හා ගිවිසුම් ප්‍රකාරව සභාව විසින් තීරණය කර ඇති පැවරීමේ ගාස්තුව වන රු.75,000.00ක මුදල අයකරගෙන අංක 11 දරණ කඩ කාමරයේ අයිතිය ශෙහානා සාමත් යන අයට පවරාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | අයිතිය ශෙහානා සාමත් යන අය වෙත පවරා ඇත. |
| 05:01:03 | පානිය ජල සුරක්ෂිතතාව පිළිබඳ අතුරු ව්‍යවස්ථාව " පානීය ජල සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම ,ජල මූලාශ්‍ර විධිමත් කිරීම ,අධීක්ෂණය කිරීම ,බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති වලට අදාළ ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම " සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා විසින් 2022-12-22 වන දින විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කරන ලද අතුරු ව්‍යවස්ථාව පනවා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | යෝජනාව පරිවර්ථන්න කරන ලදී |
| 05:01:04 | පළාත් පාලන සේවාවන්ට අදාළ ප්‍රමුඛ ක්ෂේත්‍ර 26ක් සඳහා වූ පුරවැසි ප්‍රඥප්තිය සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඒකගතාවය පළකිරීමටත් එම පුරවැසි ප්‍රඥප්තිය සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත |
| 05:01:05 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සේවක සුභසාධක සංගමය මගින් 2023-01-07 වන දිනට යොදාගෙන ඇති සේවක අභිප්‍රේරණය සඳහා සංවිධානය කරනු ලබන විනෝද චාරිකාව සඳහා 2023 වර්ෂයේ සේවක අභිප්‍රේරණය වෙනුවෙන් 2023 අයවැය ප්‍රතිපාදන මගින් මගින් වෙන්කරන ලද මුදලින් රු,74,000.00ක මුදලක් ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කර ඇත |
| 05:01:06 | **2022** වර්ෂයේ සභා අරමුදල් මගින් වෙන්කර ඇති රුපියල් **1678904.10** මුදලක් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව මන්ත්‍රී කොට්ඨාසවල ක්‍රියාකාරී ස්වේච්ඡා සමිති සඳහා ප්ලාස්ටික් පුටු ලබාදීම සඳහා යෙදවීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| 06.01 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් 2023 වර්ෂය සඳහා විවිධ අයිතමවලින් යුතු ආයතන 95 කින් සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමට ඉල්ලුම්කර ඇති අතර එම ඉල්ලුම්කරුවන් ලියාපදිංචිකර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ලියාපදිංචි කර ඇත. |
| 06.02 | කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය - අදියර 1 සඳහා ව්‍යුහ සැළසුම් ,ඇස්තමේන්තු සකස් කිරීම ,උපදේශන හා අධීක්ෂණ කටයුතු කිරීම වෙනුවෙන් උපදේශන ගාස්තු වශයෙන් පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 429.3 අනුව ලැබිය යුතු මුළු මුදලින් අත්තිකාරම් මුදලක් ලෙස රු.1,200,000.00ක මුදලක් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී. |
| 06.03 | අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය සඳහා වාස්තු විද්‍යා සැළසුම් ,ව්‍යුහ සැළසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම ,උපදේශන හා අධීක්ෂණ කටයුතු කිරීම වෙනුවෙන් උපදේශන ගාස්තු වශයෙන් පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 429.3 අනුව බිල්පත් වටිනාකමින් 5% ක වටිනාකම වන රු.435,284.32 ක මුදලක් ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | යෝජනාව පරිවර්ථන්න කරන ලදී |

<table>
<tr>
<td>06.04</td>
<td>
2022 වර්ෂයේ ක්‍රියාත්මක කළ වැඩ අවසන් කරන ලද පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ගෙවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු මහා
<table>
<tr><td>අනුඅං<br>කය</td><td>ව්‍යාපෘතිය</td><td>කොන්ත්‍රාත්සමිතිය</td><td>මුදලරු.</td></tr>
<tr><td>01</td><td>ඇත්ගාල නැගෙනහිර පොදු සමිති ශාලාව සංවර්ධනය කිරිම</td><td>ඇත්ගාලනැගෙනහිර ග්‍රාමසංවර්ධනසමිතිය</td><td>668680 .50</td></tr>
<tr><td>02</td><td>උලපනේවත්තපාරබැම්මඉදි කිරිමපළමුඅදියර</td><td>උලපනේවත්තසමගි ග්‍රාමසංවර්ධනසමිතිය</td><td>2000,000 .00</td></tr>
<tr><td>03</td><td>උලපනේවත්තපාරබැම්මඉදි කිරිමදෙවනඅදියර</td><td>උලපනේවත්තසමගි ග්‍රාමසංවර්ධනසමිතිය</td><td>2000,000 .00</td></tr>
<tr><td>04</td><td>බෝසවෝඩපහළමාර්ගයසංව ර්ධනයකිරිම</td><td>සමගිග්‍රාමසංවර්ධනස මිතිය,බෝසවෝඩ , වැටකේදෙණිය</td><td>1000,000 .00</td></tr>
<tr><td>05</td><td>පැල්ලැපිටිය දකුණ වසමේ ගොවිපල මාර්ගය සංවර්ධනය කිරිම</td><td>සාරභූමිගොවිසංවිධා නය පැල්ලැපිටියදකුණ</td><td>1498704. 45</td></tr>
<tr><td>06</td><td>ගැමුණුපුරඉරහඳගමමාර්ගය සංවර්ධනයකිරිම</td><td>ග්‍රාමසංවර්ධනප්‍රාෙද් ශීයබලමණ්ඩලය ,ගඟඉහළකෝරළේ</td><td>500000 .00</td></tr>
<tr><td>07</td><td>කෙලිගෘෘප්පුස්තකාලයසංව ර්ධනයකිරිම</td><td>මියනගොල්ලපැරකු ම්ගොවිසංවිධානය , දොළොස්බාගේ</td><td>983,000 .00</td></tr>
<tr><td>08</td><td>උලපනේවත්තප්රජාශාලාවඉ දිකිරිම</td><td>උලපනේවත්තසමගි ග්‍රාමසංවර්ධනසමිතිය</td><td>747909.35</td></tr>
<tr><td>09</td><td>පරගලඉහළමාර්ගයසංවර්ධන යකිරිම</td><td>පුබුදුග්‍රාමසංවර්ධනස මිතිය , පරගලජනපදය, උඩහේන්තැන්න</td><td>1500000 .00</td></tr>
<tr><td>10</td><td>ගල්කඩුල්ලඅමුණේවලමාර්ග යසංවර්ධනයකිරිම</td><td>හල්දොළග්‍රාමසංවර්ධ නසමිතිය හල්දොළ</td><td>1500000 .00</td></tr>
</table>
සභාව තීරණය කරන ලදී.
</td>
<td>ගෙවීම් සිදු කරන ලදී.</td>
</tr>
<tr>
<td>06.05</td>
<td>2023 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති සංවර්ධන යෝජනා කාලීන අවශ්‍යතාවයන්ට අනුකූල ලෙස සංශෝධනය කර ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.</td>
<td>ක්‍රියාත්මක වෙමින් පවතී.</td>
</tr>
<tr>
<td>06.06</td>
<td>ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් එක් මන්ත්‍රී කොට්ඨාසය සඳහා බැකෝ ලෝඩරය පැය 50ක කාලයක් සඳහා ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී.</td>
<td>සභා තීරණය අනුව ක්‍රියාත්මක වෙමින් පවතී.</td>
</tr>
<tr>
<td>06.07</td>
<td>සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ඇත්ගාල බස්නැවතුම්පොළට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු මුදල වන රු.520,000.00ක මුදලක් වැය කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු මහා සභාව තීරණය කරන ලදී.</td>
<td>සභා තීරණය අනුව කටයුතු කර ඇත.</td>
</tr>
<tr>
<td>06.08</td>
<td>2021 මන්ත්‍රී ප්‍රතිපාදන මගින් කොට්ඨාසය සඳහා වෙන්කරන ලද 2022 වර්ෂය සඳහා අවිච්ඡේද කරන ලද අමුණේවත්ත මාර්ගයේ නිශ්ශංක මහතාගේ නිවස දෙසට යන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය නඩු කටයුත්තක් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර නඩු කටයුත්ත අවසන් බැවින් නැවත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදීමට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.</td>
<td>ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ගෙවීම් සිදුකර අවසන්ය.</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| 06.09 | තාක්ෂණ නිලධාරී නිර්දේශය මත ගම්පොළවෙල පරණ පාලමෙහි බට ඉදිකරනු ලබන නව පාලමෙහි ආරක්ෂිත වැට ඉදිකිරීම වෙනුවෙන් යොදාගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව කටයුතු කරමි |
| 06.10 | විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්ෂණ නිලධාරී ඩබ්.එම්.මද්දුම බණ්ඩාර මහතාගේ කොන්ත්‍රාත් සේවා කාලය 2023 -02-16 වන දිනෙන් අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය සළකා කොන්ත්‍රාත් පදනම මත 2023-02-17 දින සිට මාස 06ක කාලයක් සඳහා නැවත සේවයේ යොදවා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. |

2023-02-14 දින පැවති ගරු මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණ ප්‍රගතිය

| | | |
|---|---|---|
| 05:01:01 | 2022.12.31 වන දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 05:01:02 | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ ක්‍රියාත්මක කිරීමේ කමිටුව සඳහාප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්‍ෂණ නිලධාරී, ආදායම් පරීක්‍ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 05:01:03 | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වල වෙන්දේසි මිළ තක්සේරු කිරීමේ කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා , ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්‍ෂණ නිලධාරී, ආදායම් පරීක්‍ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 05:01:04 | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව වෙන්දේසි කිරීම සඳහා යෝජනා කරන භාණ්ඩ වෙන්දේසි කිරීමේ කාර්ය සඳහා වෙන්දේසි කමිටුව සඳහා අප ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා, ප්‍රජා සංවර්ධන නිලධාරී, තාක්‍ෂණ නිලධාරී, ආදායම් පරීක්‍ෂක, අභ්‍යන්තර විගණන නිලධාරී, විෂය නිලධාරී හා මුදල් අයකිරීමේ නිලධාරී යන නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | සභා තීරණය අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 05:01:05 | 2022 වර්ෂයේ සභා අරමුදල් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පළමු අදියරෙහි තෙවන බිල්පත වෙනුවෙන් රුපියල් 5,664,222.27 ක මුදලක් ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ගෙවීම් සිදුකරන ලදී. |
| 05:01:06 | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(iX) හා 126(XIII)යන උප වගන්ති සමග කියවිය යුතු එම පනතේ 122(1) උප වගන්තිය යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව විසින් සාදන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පානීය ජලය සහ ජල පෝෂක සුරක්ෂිතතාවය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අදාළ වන පරිදි පනවා ගැනිමට සුදුසු බවට හා ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදී. | ක්‍රියාත්මක නිරීමට නියමිතය. |
| 05:01:07 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් දැඩි සේවා අවශ්‍යතාව සළකා රියදුරු තනතුරු 03ක් ,පුස්තකාල සහයක තනතුරු 02ක් ද පුස්තකාල කාර්යය සහයක තනතුරු 01ක් ද මාර්ග කම්කරු තනතුරු 03ක් ද විදුලි කාර්මික සහයක තනතුරු 01ක්ද වශයෙන් නව තනතුරු 10ක් මු.රෙ.71 යටතේ ඇති කරගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී |
| 05:01:08 | අසුපිනි ඇල්ල සංචාරක ආකර්ශනීය ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පතෙහි විස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස එම දෙපාර්තමේන්තුවෙන් කළ ඉල්ලීමට අනුව එම උපදේශන හා අධීක්‍ෂණ කටයුතු වෙනුවෙන් රු.526,724.10 ක මුදලක් එම විස්තරාත්මක බිල්පතේ සඳහන් කර ඇති අතර ඒ අනුව රු රු.526,724.10ක මුදලක් ඉංජිනේරුසේවා දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට සුදුසු බවට ගරු මහා සභාව තීරණය | ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී. |

| | | |
|---|---|---|
| | කරන ලදී. | |
| 05:01:09 | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අනුව කසළ අංගනයේ ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහාත් කසළ අංගනයට ප්‍රවේශවන මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීමටත් කසළ අංගනයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කරගැනීම සඳහා අත්‍යවශ්‍ය බොබ්කැට් යන්ත්‍රයක් ලබාගැනීමට කටයුතු කිරීම සඳහාත් කසළ අංගනය පිහිටා ඇති අක්කර දෙකක් ඉඩම වටා ආරක්ෂිත වැටක් සකස් කිරීම සඳහාත් ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී |
| 05:01:10 | උලපනේ ඩෙන්මාර්ක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරන කාබනික පොහොර බාහිර පාර්ශවයක් වෙත අලෙවි කිරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ තත්ත්ව සහතිකයක් ලබාගැනීම අත්‍යවශ්‍ය බැවින් මෙම වසරේ පළමු කාර්තුව අවසන් වීමට ප්‍රථම ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් නියම කරනු ලබන මුදල් ගෙවා එම තත්ත්ව සහතිකය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී |
| 05:01:11 | ගම සමග පිලිසඳරක් - 2022 වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද 2022-03-31 දිනට පසුව බිල්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් ගෙවීම් සිදුකළ නොහැකි බව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති වැඩ අවසන් ව්‍යාපෘති තුන සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යංශය වෙත සිහිකැඳවීම් සිදුකිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | අමාත්‍යංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| 05:01:12 | මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන ,ප්‍රවාහන,විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය මගින් යෝජනා ලබා ගන්නා ලද 2023 මධ්‍යම පළාත් නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ඉදිරිපත් කරන ලද ඩෙන්මාර්ක් - මහවිල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සකස් කරන ලද රු.33,881,992.80 ක ඇස්තමේන්තුව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඇස්තමේන්තුව යොමු කර ඇත' |
| 05:01:13 | පරිපාලන චක්‍රලේඛ අංක 01/ 2022 අනුව අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව දැනට තොරතුරු තාක්ෂණ පද්ධතියක් භාවිතා කරමින් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සේවා සපයනු නොලබන පළාත් පාලන ආයතන සඳහා වයඹ සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දී ඇති CAT 2020 පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමට තීරණය කර ඇතත් දැනට අප ආයතනය NEKFA ආයතනයේ මෘදුකාංගය පවත්වාගෙන යනු ලබන බැවින් එම මෘදුකාංගය ඉදිරියටත් භාවිත කිරීමටත් එම මෘදුකාංගය මගින් මාර්ගගත සේවා සැපයීමටත් ඒ සඳහා අවශ්‍ය වියදම් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී |
| 05:01:14 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරන බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු 2023-02-24 දින සිට සේවයෙන් ඉවත්වීමට නියමිත බැවින් පුරප්පාඩුවන එම තනතුර සඳහා දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීමට අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| 05:01:15 | සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍යයෙන් සිදුකළ යුතු ගෙවීම් කිරීම සඳහා කුරුඳුවත්ත ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.10,000,000.00ක ස්ථාවර තැන්පතු ලබාගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | තැන්පතු මුදල ලබාගෙන ගෙවීම් සිදුකරන ලදී. |
| 06.01 | අප ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ශිල්පීය නොවන සේවයේ තනතුරු සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් ස්ථානගත කිරීමේදී බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මගින් මසකට රු. 22,500.00ක බැගින් අදාළ දීමනාව පමණක් ගෙවන බවටත් PL 1 කාණ්ඩයේ තනතුරු සඳහා මසකට ගෙවිය යුතු වැටුප් හා දීමනා අතර වෙනස සහා අරමුදල් ප්‍රතිපාදන මගින් කළමනාකරණය කටයුතු කරගත යුතු බවත් දන්වා ඇති බැවින් ඒ අනුව, PL - 1 කාණ්ඩයට අයත් පුස්තකාල සහයක තනතුරු 01ක් ,මාර්ග කම්කරු තනතුරු 03ක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 04ක් වශයෙන් පුරප්පාඩු තනතුරු 08ක් සඳහා බහු කාර්ය සංවර්ධන සහයකයින් 08 දෙනෙකු බඳවා ගැනීම සඳහාත් එම එක් සේවකයෙක් සඳහා මසකට රු.17,050.00ක් බැගින් සේවකයන් 08ක් සඳහා වසරකට රු.1,636,800.00ක මුදලක් සභා අරමුදල් මගින් දැරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර ඇත. |
| 06.02 | පැල්ලපිටිය කනත්ත හරහා දිවෙන ජනපද මාර්ගය ගම්සභා මාර්ගයක් ලෙස පාර මැන ගැසට් පළල් කර දෙන ලෙස සමිතිය මගින් කරන ලද ඉල්ලීම අනුව එම මාර්ගය අඩි 08ක පළලින් යුත් ගම් සභා මාර්ගයක් ලෙස ගැසට් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී |
| 06.03 | පවතින දැඩි නියඟය හේතුවෙන් බල ප්‍රදේශයේ ඇතැම් කොට්ඨාසවල ජනතාව දැඩි පානීය ජල හිඟයකට මුහුණපා ඇති බැවින් එම ජනතාවගේ ඉල්ලීම අනුව සභාවේ මූල්‍ය | ඉල්ලීම් ඉදිරිපත් වූ විට කටයුතු කරනු |

| | | |
|---|---|---|
| | තත්ත්වය අනුව සභාව සතු ජල බවුසරය මගින් පානිය ජලය සැපයීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදී. | ඇත. |

## 1.නිවාඩු ඉල්ලීම්

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය අසනීප තත්ත්වය හේතුවෙන් සභා වාරයට සහභාගී විය නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.
එම ඉල්ලීම අනුමත කරන ලදී.

02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකුමාර් විදූෂණී මහත්මිය අසනීප තත්ත්වය හේතුවෙන් සභා වාරයට සහභාගී විය නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.
එම ඉල්ලීම අනුමත කරන ලදී.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 11.15 ට අවසන් කරන ලදි.

සභාපති

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2023.03.10 වනදින ගඟ ඉහළකෝරළේ

ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ය.